**ශ්‍රී ලංකා මහ බැංකුව**

**2023 සැප්තැම්බර් 30 වැනි දිනට ශේෂ පත්‍රය**

(රුපියල්)

## වගකීම් සහ හිමිකරු ප්‍රාග්ධනය

| අගෝස්තු 2023 | | | සැප්තැම්බර් 2023 | |
|---|---|---|---|---|
| | | **විදේශීය මූල්‍ය බැරකම්** | | |
| 968,180,327 | | බැංකු සහ මූල්‍ය ආයතන | 533,156,005 | |
| 42,810,815,115 | | ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 41,741,275,812 | |
| 648,422,984,230 | | ආසියානු නිශ්කාෂණ සංගමය | 713,221,645,151 | |
| 970,153,946,720 | | ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මූ.අ.) සම්බන්ධ වගකීම් | 964,545,193,345 | |
| 721,646,681,844 | 2,384,002,608,236 | අනෙකුත් | 668,393,694,382 | 2,388,434,964,695 |
| | | **දේශීය මූල්‍ය බැරකම්** | | |
| 293,796,632,439 | | බැංකු සහ මූල්‍ය ආයතන විසින් තැන්පතු | 131,874,326,497 | |
| 282,810,954 | | රජය සහ රජයේ ආයතන විසින් තැන්පතු | 1,139,515,783 | |
| 27,348,849,271 | | ප්‍රති මිලදී ගැනීමේ එකඟතාවය මත අලෙවි කළ සුරැකුම්පත් | 201,693,349,220 | |
| 1,113,759,247,649 | | සංසරණයෙහි පවත්නා මුදල් | 1,112,393,127,191 | |
| 48,793,708,262 | 1,483,981,248,575 | අනෙකුත් ගෙවිය යුතු දෑ | 39,607,859,085 | 1,486,708,177,776 |
| | | **අනෙකුත් බැරකම්** | | |
| 3,223,919 | | විලම්භිත ප්‍රදාන | 2,521,721 | |
| 1,604,522,026 | | විශ්‍රාම වැටුප් සහ අනෙකුත් පශ්චාත් රැකියා ප්‍රතිලාභ සැලසුම් | 1,603,336,493 | |
| 630,347,468 | 2,238,093,413 | විවිධ බැරකම් සහ උපචිතයන් | 733,910,720 | 2,339,768,934 |
| | | **හිමිකරු ප්‍රාග්ධනය** | | |
| 50,000,000,000 | | ප්‍රාග්ධන අරමුදල | 50,000,000,000 | |
| 213,700,630,282 | | අනෙකුත් සංචිත | 334,891,889,795 | |
| 464,098,272,989 | 727,798,903,271 | රඳවාගත් ලාභ | (312,624,211,020) | 72,267,678,775 |
| | **4,598,020,853,495** | | | **3,949,750,590,180** |
| 43,002,865,697 | | රජයේ විදේශ ණය හා ඇපකර | 41,342,136,329 | |

## වත්කම්

| අගෝස්තු 2023 | | | සැප්තැම්බර් 2023 | |
|---|---|---|---|---|
| | | **විදේශීය මූල්‍ය වත්කම්** | | |
| 1,017,587,602,833 | | මුදල් සහ මුදල් සමානයන් | 1,002,634,682,614 | |
| 89,720,313,362 | | ලාභ හෝ අලාභ තුළින් සහ අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ මිලට ඇති සුරැකුම්පත් | 90,563,537,461 | |
| 7,944,485,214 | | ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 8,509,598,258 | |
| 250,748,289,683 | | ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මූ.අ.) සම්බන්ධ වත්කම් | 248,511,940,207 | |
| 15,950,340,000 | 1,381,951,031,092 | අනෙකුත් ලැබිය යුතු දෑ | 8,064,390,000 | 1,358,284,148,540 |
| | | **දේශීය මූල්‍ය වත්කම්** | | |
| 2,535,470,276,991 | | ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | 2,169,531,533,364 | |
| 174,846,108,379 | | නැවත විකිණීමේ ගිවිසුම මත මිලදී ගත් සුරැකුම්පත් | 256,430,538,245 | |
| 344,695,600,400 | | රජයට දෙන ලද කාලීන අත්තිකාරම් | - | |
| 1,817,132,309 | | මූල්‍ය සහ අනෙකුත් ආයතනයන්හි හිමිකරු ප්‍රාග්ධන ආයෝජන | 1,817,132,309 | |
| 87,478,857,573 | | බැංකු සඳහා දෙන ලද ණය | 89,926,437,257 | |
| 35,318,731,700 | 3,179,626,707,352 | අනෙකුත් වත්කම් | 37,507,313,061 | 2,555,212,954,236 |
| | | **විදේශීය මූල්‍ය නොවන වත්කම්** | | |
| 9,481,174,748 | 9,481,174,748 | රන් | 9,083,757,182 | 9,083,757,182 |
| | | **මූල්‍ය නොවන වත්කම්** | | |
| 3,598,154,712 | | තොගය | 4,400,806,804 | |
| 3,635,938,678 | | අනෙකුත් ලැබිය යුතු දෑ හා කලින් ගෙවීම් | 3,102,678,470 | |
| 19,173,101,359 | | දේපළ, පිරියත සහ උපකරණ | 19,131,584,774 | |
| 554,745,554 | 26,961,940,303 | අස්පෘශ්‍ය වත්කම් | 534,660,174 | 27,169,730,222 |
| | **4,598,020,853,495** | | | **3,949,750,590,180** |
| 43,002,865,697 | | රජයේ විදේශ ණය හා ඇපකර | 41,342,136,329 | |

2023 ඔක්තෝබර් 31 දින
කොළඹ දිය.

ආචාර්ය පී. නන්දලාල් වීරසිංහ
අධිපති

ඩී. එස්. එල්. සිරිමාන්න
ප්‍රධාන ගණකාධිකාරී

**විගණකාධිපති වාර්තාව :-** **ශ්‍රී ලංකා මහ බැංකුවේ 2023 සැප්තැම්බර් මස 30 දිනට ශේෂ පත්‍රය සමාලෝචනය පිළිබඳ වාර්තාව**

**හැඳින්වීම**

මේ සමඟ වන, ශ්‍රී ලංකා මහ බැංකුවේ 2023 සැප්තැම්බර් මස 30 දිනට ශේෂ පත්‍රය මා විසින් සමාලෝචනය කරන ලදී. මෙම ශේෂ පත්‍රය පිළියෙල කිරීම හා ඉදිරිපත්කිරීම කළමනාකරණයේ වගකීම වේ. මාගේ සමාලෝචනය මත පදනම්ව මෙම ශේෂ පත්‍රය පිළිබඳව නිගමනයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

**සමාලෝචන විෂයපථය**

ආයතනයෙහි ස්වාධීන විගණක විසින් එහි අතුරු මූල්‍ය තොරතුරු සමාලෝචනය කිරීම සඳහා අදාල වන, සමාලෝචන කාර්යයන් සම්බන්ධ ශ්‍රී ලංකා ප්‍රමිතිය - 2410 ට අනුකූලව මාගේ සමාලෝචනය සිදු කරන ලදී. ශේෂ පත්‍රය සමාලෝචනය කිරීම, මූල්‍ය හා ගිණුම් කටයුතු සඳහා මූලිකවම වගකිවයුතු පාර්ශ්වයන්ගෙන් කරනු ලබන විමසීම් සහ අනුගමනය කරනු ලබන විග්‍රහාත්මක හා අනෙකුත් සමාලෝචන පරිපාටින්ගෙන් සමන්විත වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලව සිදු කරනු ලබන විගණනයකට වඩා සමාලෝචන විෂය පථය සැලකිය යුතු ලෙස අඩුවන අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් විගණනයේදී මෙන් හඳුනාගත හැකි සියලු වැදගත් කරුණු පිළිබඳව මම දැනුවත් වන බවට සහතිකයක් මට ලබා නොදෙනු ඇත. ඒ අනුව, මම විගණන මතයක් ප්‍රකාශ නොකරමි.

**නිගමනය**

මාගේ සමාලෝචනය මත පදනම්ව, මේ සමඟ වන ශේෂ පත්‍රය සියලුම ප්‍රමාණාත්මක ආකාරයන්ගෙන් පිළියෙල කළ නොමැති බවට විශ්වාස කිරීමට තුඩුදෙන කිසිවක් මාගේ අවධානයට යොමු නොවීය.

2023 දෙසැම්බර් මස 15 දින
ජාතික විගණන කාර්යාලයේදී ය

ඩබ්ලිව්. පී. සී. වික්‍රමරත්න
විගණකාධිපති